**කැලණිය විශ්වවිද්‍යාලය - 2020**

**------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**-----------------**

### 1.1 තත්ත්වාගණනය කළ මතය

**-------------------------------**

කැලණිය විශ්වවිද්‍යාලයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108 (1) උපවගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ආයතනයයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**-----------------------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

**---------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-----------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් කැලණිය විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ විශ්වවිද්‍යාලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ කැලණිය විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, කැලණිය විශ්වවිද්‍යාලය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

-----------------------------------------------------------------------------

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

-----------------------------------------------------------------

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරිබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

------------------------------------------------------------------------

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7හි 65 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම්වල ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.1,641,021,283ක් වූ ස්ථාවර වත්කම් සම්පූර්ණයෙන් ක්ෂයකර තිබුණු නමුත් තවදුරටත් භාවිතයට ගනිමින් පැවතුණි. ඒ අනුව ඇති වූ ඇස්තමේන්තු ගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට සමාලෝචිත වර්ෂය තුලදීද කටයුතුකර නොතිබුණි. | තාක්ෂණික දැනුමකින් යුත් අධ්‍යයන කාර්යමණ්ඩල සාමාජිකයන් 4 දෙනෙකුගෙන් යුත් තාක්ෂණික කමිටුවක් පත් කර ඇත. මෙ සම්බන්ධ ප්‍රායෝගික තත්වයන්ද සලකා බලා ප්‍රතිපත්තිමය නිර්දේශ ඉදිරි මූල්‍ය කමිටුවට හා පාලක සභවට ඉදිරිපත් කිරීමට කටයුතු කරණු ඇත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂය තුළදී මිලදීගෙන තිබුණු වටිනාකම රු. 30,440,902ක් වූ ජෙනරේටරයක් සහ එකතු පිරිවැය රු.1,408,100ක් වූ ඡායාපිටපත් යන්ත්‍ර 3ක් නිවැරදි වත්කම් පන්තීන් යටතේ ගිණුම්ගත නොකිරීම නිසා සමාලෝචිත වර්ෂයේ ක්ෂය රු.2,725,410ක් අඩුවෙන් දක්වා තිබීම හේතුවෙන් වර්ෂයේ අතිරික්තය එම ප්‍රමාණයෙන් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | වත්කම් වර්ගීකරණ දෝෂය 2021 වසරේදී නිවැරදි කර ඇත. | නිවැරදිව වර්ගීකරණයන් යටතේ වත්කම් ගිණුම්ගත කර නිවැරදිව ක්ෂය ගණනය කළ යුතුය. |
| (ආ) කෙරීගෙන යන වැඩ යටතේ පැවති එකතු වටිනාකම රු.790,400,309 ක් වූ ගොඩනැගිලි 04ක් සමාලෝචිත වර්ෂයේ සිට භාවිතයට ගැනීම හේතුවෙන් ගොඩනැගිලි යටතේ ප්‍රාග්ධනිත තර තිබුණ ද එම ගොඩනැගිලි වලට අදාලව රු.39,520,015ක් වූ වර්ෂයේ ක්ෂය ගිණුම්ගත නොකිරීම හේතුවෙන් වර්ෂයේ අතිරික්තය එම ප්‍රමාණයෙන් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | ඉදිකිරීම් ප්‍රාග්ධනිත කිරීම සිදුකරන්නේ අදාල සියලු ඉදිකිරීම් කටයුතු අවසන් බව හා විශ්වවිද්‍යාලයේ භාවිතය සඳහා යොදාගත හැකි බවට ව්‍යාපෘති කළමනාකරණ කාර්යාලයේ දැනුම් දීම මත වේ. | අදාළ ගොඩනැගිලි 2020 වර්ෂයේ සිට ඉදිරියට භාවිතයට ගත හැකි බව ව්‍යාපෘති කළමනාකරණය විසින් නිර්දේශ ලබා දී තිබූ අතර එම ගොඩනැගිලි භාවිතයට ගනිමින් පැවතීම හේතුවෙන් ක්ෂය ගණනය කළ යුතුය. |

### 1.5.4 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම | අනුරූපී වාර්තා අනුව වටිනාකම | වෙනස | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු.. | | |
| වර්ෂය අවසාන දිනට භෞතික තොග වටිනාකම | 44,269,722 | 48,848,301 | 4,578,579 | වාර්ෂික තොග සත්‍යාපන වාර්තා අනුව භෞතික තොග වටිනාකම හා මූල්‍ය තත්ත්ව | තොග සත්‍යාපන වාර්තා අනුව නිවැරදි තොගය මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු |

| | | |
|---|---|---|
| | ප්‍රකාශනයේ දක්වා ඇති තොග වටිනාකම අතර වෙනසට හේතු හඳුනා ගැනීම සඳහා මේ වන විට සැසඳුම් සිදුකරමින් පවතී. | කළ යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ශිෂ්‍යත්ව කඩකිරීම මත කථිකාචාර්යවරු 07 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.41,583,486 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වාම අයවී නොතිබුණි. | තිදෙනෙකුට එරෙහිව නඩු පවරා ඇති බවත් එක් අයෙකුට එරෙහිව නඩු පැවරීමට කටයුතු කරමින් සිටින අතර අනෙක් තිදෙනාගේ කැමැත්ත අනුව ඔවුන්ගේ අර්ථසාධක අරමුදලින් හා විශ්‍රාම වැටුප් අරමුදලින් අය කරනු ලැබේ. | අයවිය යුතු මුදල් කඩිනමින් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) කාර්යමණ්ඩලයේ නිලධාරීන් 17 දෙනෙකුට ලබා දී තිබූ ණය මුදලින් එකතුව රු.912,902 ක ණය වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී කිසිඳු වාරිකයක් අය කරගෙන නොතිබුණි. | නිලධාරීන් 14 දෙනෙකුගෙන් අර්ථසාධක අරමුදල් නිදහස් කිරීමේදී අයකර ගැනීමට සහ නිලධාරීන් 3 දෙනෙකුගෙන් වාරික වශයෙන් අයකර ගැනීමට මේ වනවිට කටයුතු කර ඇත. | අයවිය යුතු මුදල් කඩිනමින් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

### 1.6.2 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් යටතේ දක්වා තිබුණු එකතු වටිනාකම රු.2,615,824 ක් වූ අවලංගු කල චෙක්පත් 257ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | නැවත ගෙවීම් කිරීම සඳහා ඉල්ලීම් ඉදිරිපත් වී ඇති චෙක්පත්වලට අදාළව ගෙවීම් කටයුතු සිදු කෙරෙමින් පවතින අතර එලෙස ඉල්ලීම් ඉදිරිපත් වී නොමැති හා සිහිකැඳවීම් ලිපිවලට ප්‍රතිචාර නොමැති, මාස 06 ඉක්මවා ඇති චෙක්පත්වලට අදාළ අගයන් මුදල් රෙගුලාසි ප්‍රකාරව ආදායමට ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග සිදු කෙරෙමින් ඇත. | ප්‍රමාදයන්ගෙන් තොරව නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය සහ 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ | | | |
| (i) මුදල් රෙගුලාසි 371 | 2016 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය තුළදී ලබා දී තිබූ එකතුව රු.4,410,277ක අත්තිකාරම් පියවා නොතිබුණි. | කළමනාකරණය විසින් අදහස් දක්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii) මුදල් රෙගුලාසි 571 | වර්ෂ දෙක ඉක්මවූ එකතු වටිනාකම රු.63,460,015ක් වූ විවිධ තැන්පතු 552 ක් සම්බන්ධයෙන් හා වසර පහකට වඩා වැඩි කාලයක් ගතවූ රු.16,946,500 ක් වූ පුස්තකාල තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | 2021 වර්ෂයේදී තැන්පතු කාලය වර්ෂ 02 ඉක්ම වූ තැන්පතු ආදායමට ගැනීමට කටයුතු කරනු ලැබේ. පුස්තකාල තැන්පතු අවශ්‍ය සනාථ ලද පසු ශිෂ්‍යයින් වෙත නිදහස් කරනු ලැබේ. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) 2006 ජනවාරි 25 දිනැති රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3.1 හා 4.3.2 වගන්ති | විශ්වවිද්‍යාලයේ නව කාය සංවර්ධන මධ්‍යස්ථාන ප්‍රදේශයේ භූමිය අලංකරණය කිරීම සම්බන්ධ කාර්යය ඉටුකිරීමට අදාල රු.11,929,352 ක් වූ (වැට් රහිත) මුළු පිරිවැය ඇස්තමේන්තුව සඳහා උපකුලපතිවරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. | සියළුම ආශ්‍රිත වියදම් ඇතුළත් කර මුළු පිරිවැය ඇස්තමේන්තුවක් සකස් කර ආයතන ප්‍රධානියාගේ අනුමැතිය ලබා ගැනීමට මින් ඉදිරියට කටයුතු කරනු ලැබේ. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන පරිදි කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.306,835,849ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.690,497,428ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.383,661,579ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට සමාලෝචිත වර්ෂයේ අභ්‍යන්තර ආදායම හා මහපොළ ප්‍රදාන අඩු වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ හිමිකම් යටතේ දක්වා තිබුණ කැබිනට් මණ්ඩල අනුමැතිය ලත් ගොඩනැගිලි ව්‍යාපෘති අරමුදල් දෙකක එකතු වටිනාකම වූ රු.17,272,549 ක් සමාලෝචිත වර්ෂය තුළදී අපේක්ෂිත කාර්යයන් වෙනුවෙන් උපයෝජනය කර නොතිබුණි. | රු.16,422,549/-ක් වන "CODL Capital Reserve" අරමුදල යටතේ Six Storied Examination Building ව්‍යාපෘතිය මේ වනතෙක් අවසන් වී නොතිබුණි.<br>රු.850,000/- ක ශේෂයක් පවතින ව්‍යාපෘතිය මේ වන තෙක් ආරම්භ වී නොමැති අතර ව්‍යාපෘතිය ආරම්භ කළපසු ඒ වෙනුවෙන් උපයෝජනය කෙරෙනු ඇත. | අදාළ ව්‍යාපෘති කඩිනමින් ආරම්භ කර අරමුදල් කාර්යක්ෂමව උපයෝජනය කළ යුතුය. |

### 3.2 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| නිසි සැලසුමකින් තොරව විශ්වවිද්‍යාලයීය 60 වන සංවත්සරය වෙනුවෙන් 2019 වර්ෂයේදී මිලදීගෙන තිබූ එකතුව රු.2,330,055 ක් වූ තෑගි භාණ්ඩ විගණිත දිනය වූ 2021 අප්‍රේල් 01 වන දින වනවිටද නිකුත් නොකර ගබඩාවෙහි පැවතුණි. | විශ්වවිද්‍යාලයේ 60 වන සංවත්සරය සඳහා කමිටු තීරණයක් මත ආයතනික තෑගි සඳහා අදාළ මිලදීගැනීම් කළ අතර ඒ ඒ අංශවල අවශ්‍යතාවය මත ඉල්ලීම් කළවිට නිකුත් කිරීම් සිදුකරනු ලැබේ. | අවශ්‍යතාවය නිවැරදිව හඳුනාගෙන මිලදී ගැනීම් කිරීමට අවධානය යොමුකළ යුතුය. |

### 3.3 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| වසර 2 කදී ඉදිකර නිම කිරීම සඳහා 2016 වර්ෂයේදී ඉදිකිරීම් ආරම්භ කරන ලද ඇස්තමේන්තුගත වටිනාකම රු. මිලියන 183 ක් වූ පරිගණක මධ්‍යස්ථාන ගොඩනැගිල්ල සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් | පරිගණක මධ්‍යස්ථාන ගොඩනැගිල්ලෙහි ඉදිකිරීම් කටයුතු ප්‍රමාදය සඳහා විශ්වවිද්‍යාලය විසින් ප්‍රමාද ගාස්තු අය කිරීමට කටයුතු කර ඇත. එමෙන්ම කොන්ත්‍රාත්කාර රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙත මෙම ඉදිකිරීම කඩිනමින් සම්පූර්ණ කර ලබා දෙන ලෙස විශ්වවිද්‍යාලය විසින් | ප්‍රමාදයන් වලක්වා ගනිමින් සැලසුම් කළ පරිදි ඉදිකිරීම් සම්පූර්ණ කරවා ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| 31 දින වනවිටත් නිමකර නොතිබුණි. | ලිඛිතව කිහිප වරක්ම දන්වා ඇත. 2020 දෙසැම්බර් 31 දින වනවිට රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව විසින් රු.මිලියන 174 ක ඉදිකිරීම් වැඩ ඉටුකර ඇත. | |

**3.4 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට විශ්වවිද්‍යාලයේ අනුමත අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලය පිළිවෙලින් 804ක් හා 896 ක් වූ අතර තත්‍ය කාර්යමණ්ඩලය පිළිවෙලින් 653ක් හා 806 ක් වූයෙන් පුරප්පාඩු පිළිවෙලින් 151 ක් හා 90 ක් පැවතුණි. | පුරප්පාඩු සඳහා බඳවා ගැනීමේ කටයුතු සිදුකරන බවත් කොවිඩ් 19 වසංගත තත්ත්වය යටතේ කාර්යාල කටයුතු ප්‍රමාණවත් පරිදි ඉටු නොවූ නිසා බඳවා ගැනීම් සිදු නොකරන ලදී. | කාර්යමණ්ඩල අවශ්‍යතාවයන් කාලීනව සමාලෝචනය කර අත්‍යවශ්‍ය වූ තනතුරු සඳහා පමණක් බඳවා ගැනීමට කටයුතු කළ යුතුය. |